# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2039/26 - 2017 ඔක්තෝබර් මස 04 වැනි බදාදා - 2017.10.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : 6/3/7/15/5.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/05/2007/MV/110.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතෙන් සංශෝධිත පරිදි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගගල පල්ලේසිය පත්තුවේ තලාගොඩ ග්‍රාම නිලධාරි වසමේ තලාගොඩ (කොටසක්) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2017.07.12 දින සම්මත කරන ලද, අවසාන ගම් පිඹුරු අංක 535හි, අතිරේක අංක 16 හි, පත්‍ර අංක 13 දරන සැළැස්මේ, පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම්.

1. **කැබලි අංක 1202**
ඉඩමේ නම: –; විස්තරය : ජල මාර්ගය; හිමිකම් කියන අය: රජය; ඉඩම් ප්‍රමාණය: හෙක් 0.0260.

2. **කැබලි අංක 1203**
ඉඩමේ නම: වේරගොඩ මූකලාන, වේරගොඩ; විස්තරය : හේන; හිමිකම් කියන අය: රජය, තලාගොඩ පදිංචි රත්නායක මුදියන්සේලාගේ උක්කුබණ්ඩා මයා විසින් භුක්ති විඳී; ඉඩම් ප්‍රමාණය: හෙක් 0.4855.

3. **කැබලි අංක 1204**
ඉඩමේ නම: –; විස්තරය : මාර්ගය; හිමිකම් කියන අය: රජය; ඉඩම් ප්‍රමාණය: හෙක් 0.0144.

4. **කැබලි අංක 1205**
ඉඩමේ නම: වේරගොඩ මූකලාන, වේරගොඩ; විස්තරය : වත්ත; හිමිකම් කියන අය: තලාගොඩ පදිංචි රත්නායක මුදියන්සේලාගේ උක්කුබණ්ඩා මයා; ඉඩම් ප්‍රමාණය: හෙක් 0.3940.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2017 නොවැම්බර් මස 15 වැනි දින පෙ.ව. 9.00 ට නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.


1A - G 26379 - 22 (2017/10)


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

තව ද, 2017 නොවැම්බර් මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ආත්මා දිලුක්ෂි ජයරත්න,
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2017 සැප්තැම්බර් මස 30 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 583

---

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : ම/සං/ඉ/3/සීඊපී.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2016/එච්ඩබ්/279.

කැඩැස්තර සිතියම් අංක 510821 හි කලාප අංක 05න් 02 වැනි කලාපයේ 03 වැනි පත්‍රයේ කැබලි අංක 294, 295, 298 දරන ඉඩම් කොටස්, කැඩැස්තර සිතියම් අංක 510821 හි කලාප අංක 05න් 02 වැනි කලාපයේ 06 පත්‍රයේ කැබලි අංක 321, 322, 323 වශයෙන් පහත පරිදි සංශෝධනය වී ඇත.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 245ඒ, සූරිපාළුව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සූරිපාළුව ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවට ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 510821, කලාප අංක 05න් 02 වැනි කලාපය, පත්‍ර අංක 6 හා 2017.06.30 දිනැති සිතියමේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.6670 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි 321 සිට 323 (කැබලි 03) ට මායිම්;

01. **කැබලි අංක 321**
ඉඩමේ නම: වැවේ කුඹුර; ඉඩමේ විස්තරය: ඔිවිට; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: කඩවත, සූරිගම, පල්ලිය පාර, නො. 54/1 හි පදිංචි ඒ. එම්. කාන්ති සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.0280.

02. **කැබලි අංක 322**
ඉඩමේ නම: වැවේ කුඹුර; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: කඩවත, සූරිගම, පල්ලිය පාර, නො. 54/1 හි පදිංචි ඒ. එම්. කාන්ති; ප්‍රමාණය: හෙක්. 0.5066.

03. **කැබලි අංක 323**
ඉඩමේ නම: වැවේ කුඹුර; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: කඩවත, සූරිපාළුව, නො. 40 හි පදිංචි ඩී. ලිලිනාවතී සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.1324.

ජී. එස්. අයි. විමලසේන,
ප්‍රාදේශීය ලේකම්,
මහර.

2017 සැප්තැම්බර් මස 15 වැනි දින,
මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 584

.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.